**මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව - 2023**

**-------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිත යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| (අ) | වටිනාකම රු.1,844,420 ක් වූ කසළ අඹරන ස්ථානය හා ජල ටැංකිය වෙනුවෙන් 2023 වර්ෂය සඳහා රු.43,834 ක ක්ෂය හඳුනාගෙන නොතිබුණි. | පිළිගන්නා බව. | නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | ඉදිකරමින් පැවති මාතෘ සායන ගොඩනැගිල්ලේ රු.793,804 ක වැඩ පමණක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සහතික කර තිබුණු නමුත් රු.1,337,323 ක් වූ මුළු වත්කම ප්‍රාග්ධනිත කිරීම නිසා වත්කම් රු.543,519 කින් වැඩිවී තිබුණි. | -එම- | -එම- |
| (ඇ) | 2021 වර්ෂයේදී කුට්ටිගල් මාර්ග ඉදිකිරීම වෙනුවෙන් ලැබුණු රු.283,490 ක ප්‍රාග්ධන ප්‍රදාන දෙවරක් සටහන්වීමේ වරද නිවැරදි කිරීම වෙනුවට නැවත වරක් ප්‍රාග්ධන ප්‍රදාන ගිණුමට බැර කිරීම නිසා ප්‍රාග්ධන ප්‍රදාන රු.566,980 කින් වැඩිවී තිබුණි. | -එම- | -එම- |
| (ඈ) | 2023 දෙසැම්බර් 31 දිනට වීථි පහන් තොගය රු.101,942 ක් වුවත් එය රු.129,000 ක් ලෙස වැඩියෙන් දක්වා තිබුණි. | -එම- | -එම- |
| (ඉ) | සභාවට අයත් ස්ථාවර තැන්පත් ගිණුමක් මුදල් පදනම මත ගිණුම් තබා තිබුණු අතර 2023 ජුනි 18 දි සිට 2023 දෙසැම්බර් 31 දින දක්වා කාලයට අදාළ රු.34,964 ක පොලිය ගිණුම්ගත කර නොතිබුණු අතර, ස්ථාවර තැන්පතුවකට අදාළ 2024 සඳහා ලැබිය යුතු පොලී රු.40,362 ක් සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | -එම- | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඊ) | කසළ කළමනාකරණ මධ්‍යස්ථානයේ නල ළිඳ පවිත්‍ර කිරීමේ කටයුතු වෙනුවෙන් LDSP ව්‍යාපෘතිය වෙතින් ලද රු.71,300 ක් වූ පුනරාවර්තන වියදම් ප්‍රාග්ධන ප්‍රදාන තුළ දෙවරක් සටහන් කර තිබුණි. | -එම- | නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතුය. |
| (උ) | 2023 වර්ෂයේදී රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීම් සිදු කර නොතිබිය දී රු.785,218 ක් උපචිත වියදම් ලෙස නොදක්වා ගෙවීම් ලෙස දක්වා තිබුණි. | -එම- | -එම- |

## 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාතර්ා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| (අ) | වීථි පහන් තොග ලේඛනය අනුව 2023 වර්ෂයේ මිලදී ගැනීම් රු.832,800 ක් වුවත් LG 13 වාර්තාව අනුව මිලදී ගැනීම් රු.789,630 ක් වූයෙන් රු.43,170 ක වෙනසක් විය. | පිළිගන්නා බව. | වෙනසට හේතු සොයා නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය |
| (ආ) | මූල්‍ය ප්‍රකාශන සටහන් තුළ දක්වා ඇති පොදු ගබඩා තොග ශේෂය රු.168,249 ක් වුවත්, පොදු ගබඩා ලේඛනය අනුව එය රු.152,949 ක් වූයෙන් රු.15,300 ක වෙනසක් විය. | -එම- | -එම- |
| (ඇ) | උපලේඛනය අනුව රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට 2023 වර්ෂයේ ගෙවීම් රු.653,164 ක් වුවත් ලෙජර් ගිණුම් අනුව එය රු.785,218 ක් ලෙස දක්වා ඇති බැවින් රු.132,054 ක වෙනසක් විය. | -එම- | -එම- |

## 1.6.3 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැති වීම

| | විෂය | මුදල<br>රු. | නොසැපයූ විගණන සාක්ෂි | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභාවට අයත් ඉඩම් | 90,960,000 | (i) ඉඩම් අයිතිය සනාථ කරන පැවරුම් සහතික<br>(ii) ඔප්පු<br>(iii) ඉඩම් මිනුම් වාර්තා | පිළිගන්නා බව. | තහවුරු කිරීම් ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | සේවක ණය | 1,129,813 | (i) උපලේඛනය | පිළිගන්නා බව. | තහවුරු කිරීම් ඉදිරිපත් කළ යුතුය. |
| (ඇ) | රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට ගෙවීමට ඇති මුදල | 1,520,745 | (i) උපලේඛනය | -එම- | -එම- |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්ම වූ වියදම රු.699,149 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්ම වූ වියදම රු.5,616,894 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 3,068,000 | 4,374,187 | 4,294,437 | 794,834 | 2,249,224 | 2,401,534 | 1,790,450 | 715,084 |
| (ii) | කුලී | 9,148,384 | 7,187,603 | 7,274,603 | 1,470,809 | 7,550,236 | 6,476,026 | 6,385,414 | 1,557,809 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,242,200 | 1,192,300 | 2,856,400 | 381,450 | 6,156,600 | 6,144,636 | 5,912,336 | 2,045,550 |
| (iv) | වෙනත් ආදායම් | 37,810,917 | 27,066,643 | 22,781,237 | 30,229,344 | 30,974,200 | 17,284,759 | 11,186,184 | 25,943,938 |
| | | 51,269,501 | 39,820,733 | 37,206,677 | 32,876,437 | 46,930,260 | 32,306,955 | 25,274,384 | 30,262,381 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කායර්සාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **වරිපනම් හා බදු** | | |
| (i) | සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට රු.254,700 ක් ලෙස පැවති ව්‍යාපාර බදු හා කර්මාන්ත බදු හිඟය සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිට රු.622,250 ක් දක්වා සියයට 144 කින් ඉහළ ගොස් තිබුණු නමුත් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් අයකර ගැනීම කඩිනම් කළ යුතුය. |
| (ii) | ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කසළ බදු එකතු කිරීම වෙනුවෙන් ලැබිය යුතු රු.1,823,550 ක් සමාලෝචිත වර්ෂයේදී අයකරගෙන නොතිබුණි. | -එම- | -එම- |
| (iii) | ගෘහ ඒකක වෙනුවෙන් සමාලෝචිත වර්ෂයට අදාළව බිල්කළ රු.409,400 ක කසළ බදු වලින් සමාලෝචිත වර්ෂයේදී සියයට 50 ක් වූ රු.204,600 ක් පමණක් අයකර තිබුණි. | -එම- | ප්‍රවර්ථන ආදායම් අය කර ගැනීම කඩිනම් කළ යුතුය. |
| (iv) | 2023 වර්ෂයට පෙර පැවති රු.233,600 ක හිඟ කසළ ගාස්තු වලින් රු.70,600 ක් පමණක් සමාලෝචිත වර්ෂයේදී අයකරගෙන තිබුණි. ඒ අනුව හිඟ කසළ ගාස්තු වලින් සියයට 70 ක් අයකරගෙන නොතිබුණි. | -එම- | හිඟ ආදායම් අයකර ගැනීම කඩිනම් කළ යුතුය. |
| (ආ) | **කුලී** | | |
| | මස්කඩ, මාළු ලැලි සහ සතිපොළ බදුදීම් වෙනුවෙන් ලැබිය යුතු රු.1,445,809 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිට අයකරගෙන නොතිබුණි. | මස්කඩ වලට අදාළව රු.25,000 ක් අයකරගෙන ඇති බව හා ඉතිරි හිඟ මුදල් අයකර ගැනීම සඳහා නඩු පවරා ඇති බව. | -එම- |
| (ඇ) | **බලපත්‍ර ගාස්තු** | | |
| (i) | වෙළඳ බලපත්‍ර වෙනුවෙන් අයවිය යුතු රු.46,750 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිට අයකරගෙන නොතිබුණි. | අයකර ගැනීමට කටයුතු කරන බව. | අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) | සභා බල ප්‍රදේශයේ පිහිටි සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි වී ඇති හෝටලයකින් වාර්ෂික ආදායම වෙනුවෙන් අයවිය යුතු සියයට 01 ක බලපත්‍ර ගාස්තු අයකර ගෙන නොතිබුණි. | -එම- | -එම- |
| (ඈ) | **වෙනත් ආදායම්** | | |
| (i) | දැන්වීම් පුවරු වෙනුවෙන් අයවිය යුතු රු.334,700 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිට අයකරගෙන නොතිබුණි. | -එම- | අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ii) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2023 දෙසැම්බර් 31 ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.2,920,589 ක් හා මුද්දර ගාස්තු රු.25,484,455 ක් අයකරගෙන නොතිබුණි. | උසාවි දඩ හා මුද්දර ගාස්තු ලබාගැනීමට ඉල්ලීම් කර ඇති බව. | -එම- |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණක් පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය හැකිව තිබූ නමුත් 2023 දෙසැම්බර් 31 දින වනවිටත් එම කාරණා වෙනුවෙන් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | ඉදිරි කටයුතු කරන බව. | අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමට ක්‍රියා කළ යුතුය. |

### 3.2 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|
| 2023 වර්ෂයේදී පාරවල්, බෝක්කු, පාලම් අලුත්වැඩියා සහ නඩත්තු වෙනුවෙන් රු.10,000,000 වෙන්කර තිබුණු නමුත් එයින් රු.3,657,606 ක් පමණක් සමාලෝචිත වර්ෂයේදී වියදම් කර බොරළු මාර්ග අලුත්වැඩියා කර තිබුණි. එය ඇස්තමේන්තුවෙන් සියයට 37 ක් තරම් පහළ ප්‍රතිශතයක් විය. | ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලැබීම ප්‍රමාදවීම නිසා ඉටුකළ නොහැකි වූ බව. | ඇස්තමේන්තුගත ව්‍යාපෘති අදාළ වර්ෂය තුළදීම ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1. වාෂරීක ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|
| 2023 ක්‍රියාකාරි සැලැස්ම අනුව සුභ සාධක ගෙවීම් යටතේ රු.9,475,000 ක් වූ මුළු වෙන්කිරීමෙන් සියයට 85 ක් වූ රු.8,025,000 ක් වෙනත් සුභ සාධක වියදම් ලෙස පමණක් සඳහන් කර තිබුණු අතර, එම කාර්යයන් මොනවාද යන්න නිශ්චිතව හඳුනාගෙන නොතිබුණි. | ඉදිරියේදී ක්‍රියාකාරි සැලැස්ම අනුව කටයුතු කරන බව. | ක්‍රියාකාරි සැලැස්ම අනුව ක්‍රියාකළ යුතුය. |

### 4.2 පාරිසරික ගැටලු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|
| ලෝලුගස්වැව පිහිටි ඝන අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණය සිදුකරන කසළ කළමනාකරණ මධ්‍යස්ථානය වෙනුවෙන් මධ්‍යම පරිසර අධිකාරිය වෙතින් පරිසර බලපත්‍රයක් ලබාගැනීමට සමාලෝචිත වර්ෂයේදී ද කටයුතු කර නොතිබුණි. | ගාස්තු ගෙවා ඇති බව හා 2024 වර්ෂයේදී පරිසර ආරක්ෂණ බලපත්‍රය ලබාගැනීමට කටයුතු කරන බව. | පරිසර බලපත්‍ර ලබාගැනීම කඩිනම් කළ යුතුය. |